# සහල් හා බැඳී ලාංකේය ආහාර සංස්කෘතිය පෝෂණයෙහි ලා බෞද්ධ ආගමික බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ[1]*

"සහල්" ගරුත්වය හා පූජනීයත්වය හේතු කොට ගෙන "බුද්ධ භෝගය" ලෙස ව්‍යවහාර කරන අතර සහල් මත පදනම් ව විවිධාංගීකරණය වූ ආහාර සංස්කෘතියක් ගොඩනැගෙයි. වී වැපිරීමේ සිට බත් පරිභෝජනය කරනා අවස්ථාව දක්වා ම විශේෂයෙන් ගොඩනැගුණු ආහාර සංස්කෘතිය හා බැඳි විවිධ චාරිත්‍ර වාරිත්‍ර, පුද පූජා, උත්සව මෙන් ම ඓතිහාසික කාරණාවන් ද හඳුනාගත හැකි ය. ආගමානුකූල ව සාම්ප්‍රදායික තීක්ෂණ බුද්ධිය හරහා ගෝලීය පුරවැසියන් ආර්ථිකව හා මානසිකව පොහොසත් කිරීමට සහල් හා බැඳි මෙම ආහාර සංස්කෘතියේ බලපෑම පිළිබඳ විමසුමක යෙදීම මෙම පර්යේෂණයේ අපේක්ෂාවයි. සූත්‍ර පිටකය, විනය පිටකය, ජාතකට්ඨකථා වැනි සාහිත්‍ය මූලාශ්‍රය මත පදනම් ව මෙම පර්යේෂණය සිදු කෙරේ. බෞද්ධ ආගමානුකූල සහල් සංස්කෘතිය විමසීමේ දී දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රාගත ව ඇති සහල්හි උපත පිළිබඳ සදහන් වැදගත් වේ. දළදා වහන්සේ උදෙසා සිදු කරන කිරිපිඬු පූජාව, ජයසිරිමා හාමුදුරුවන් උදෙසා සිදු කරන අලුත් සහල් මංගල්‍යය ආදි ආගමානුකූල සාම්ප්‍රදායික සංස්කෘතික උත්සව සහල් හා බැඳී ආහාර සංස්කෘතියේ සුවිශේෂී අවස්ථාවන් ලෙස හඳුනාගත හැකි ය. සම්මා ආජීවය යටතේ කෘෂිකර්මාන්තය නිර්දේශ කරන බුදු හිමියන් වී වගාව පාදක කොට විවිධ වූ සූත්‍ර දේශනාවන් සිදු කර ඇති ආකාරය ත්‍රිපිටකාගත ව දැකගත හැකි ය. උම්මග්ග ජාතකය ආදි ජාතක කථා පරිශීලනයෙන් ද සහල් හා බැඳී ආහාර සංස්කෘතියෙහි ආගමික මුහුණුවර පිළිබඳ කරුණු ගෙනහැර දැක්විය හැකි ය. ලාංකීය වී ගොවිතැනේ අත්‍යාවශ්‍ය සාධකයක් වූ වැව පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඇරඹුණු බවට සාක්ෂ්‍ය තිබේ. පාළි ග්‍රන්ථවල වී වර්ග 317ක් හඳුනාගෙන ඇත. වී වර්ග 1000ක් පමණ ව්‍යවහාරයේ පැවති බවට මත පවතින අතර හීල් බත්, දිය බත්, මුරුතැන් බත්, මළබත්, මුත්තෙට්ටුව හා ඇඹුල ලෙස බත විවිධ වේ. සහල් උපයෝගී කොට රසකැවිලි, කැඳ, අතුරුපස ආදිය පිළියෙල කළ හැකි ය. මේ ආකාරයට විවිධ රසයන්, හැඩයන් හා වර්ණයන් එක්කාසු කරමින් ආහාර සැකසීම සිදු කළ හැකි අතර එම ආහාර පරිභෝජනය හා බෙදා දීම පිළිබඳ ඉතා වැදගත් ආදර්ශයන් බුදුදහම සපයයි. මේ අනුව සහල් හා බැඳී යහපත් ආහාර සංස්කෘතියක් ගොඩනගා ගැනීමෙන් නිරෝගීකම, මානසික සංතෘප්තිය පමණක් නො ව ආර්ථික දියුණුවත් ආගමානුකූල පරිසරයක් තුළ අත්විඳිය හැකි ය. ආහාර සංස්කෘතිය පෝෂණය වීමෙහි ලා බුදුදහමේ ආභාසය බෙහෙවින් වැදගත් වන බව පෙන්වා දිය හැකි අතර බුද්ධිය මෙහෙයවා ගෝලීය වසයෙන් ආර්ථික වත් මානසික වත් පොහොසත් පුරවැසියන් ලෙස අනාගතය සාර්ථක කරගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ආහාර සංස්කෘතිය, පොහොසත්කම, බුදුදහම, සහල්

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com